BIODIVERSITY FOR FOOD AND NUTRITION

# Biodiversity for Food and Nutrition Initiative



RESEARCH PROGRAM ON Agriculture for Nutrition and Health

# SRI LANKA

## මානව පෝෂණය සඳහා ජෛව විවිධත්වය (Bio-diversity for food and Nutrition - BFN) ව්‍යාපෘතිය

සංවර්ධන ඉලක්ක සපුරමින් ජාතියේ ආහාර සුරක්ෂිතතාව සංවර්ධනය මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන අතර, එම අරමුණ මුදුන්පත් කර ගැනීම වස් ව්‍යාපෘතිය මගින්, ආහාර සුරක්ෂිතතාව සාක්ෂාත් කර ගැනිම, පෝෂණය වැඩිදියුණු කිරිම හා තිරසාර කෘෂිකාර්මික ප්‍රවර්ධනය යන කරුණු ඔස්සේ මානව පෝෂණය සඳහා ජෛව විවිධත්ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

මානව පෝෂණය සඳහා ජෛව විවිධත්වය ව්‍යාපෘතිය, ජාතික ආහාර සුරක්ෂිතතාවය, කෘෂි ජෛව විවිධත්වය තිරසාර හා ඵලදායී භාවිතය මත ප්‍රධාන වත්මන් ගැටලු විසඳීම සඳහා මූලික දැනුම, ප්‍රතිපත්ති හා නියාමන රාමුව හා දැනුවත් කිරීම් මත ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාව, කෙන්යාව, බ්‍රසීලය, තුර්කිය යන රටවල් 04 අතර ක්‍රියාත්මක ව්‍යාපෘතියකි. මානව පෝෂණය සඳහා ජෛව විවිධත්ව ජාත්‍යන්තර ව්‍යාපෘතිය සඳහා මූල්‍යමය දායකත්වය GEF (Global Environment Facility) ව්‍යාපෘති යටතේ UNEP (United Nations Environment Programme) සහ FAO (Food & Agriculture Organization of the United Nations) මඟින් ලබාදේ. ශ්‍රී ලංකාව තුළ මෙම ව්‍යාපෘතිය සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය අනුග්‍රහය ලබා දෙන අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියත්මක වේ.


BFN ව්‍යාපෘතිය ජාතික මට්ටමේ හවුල් කරුවන් සමග ඇතිකරගත් බහු ආංශික සහයෝගිතාවය තුලින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන්, පුහුණු හා වැඩමුළු තොරාගත් ව්‍යාපෘති ප්‍රදේශන්හි හා ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීම මගින්, ආහාර සුරක්ෂිතතාව, පෝෂණය ඉහළ නැංවීම සහ සෞඛ්‍ය වැඩිදියුණු කිරිම මෙන්ම, කෘෂි ජෛව විවිධත්වය සහ තිරසාර කෘෂිකර්මය ඵලදායි ලෙස යොදා ගැනීම වැඩිදියුණු කිරීම සිදු කරනු ලැබේ.

මානව පෝෂණය සඳහා ජෛව විවිධත්වය ව්‍යාපෘතියේ ප්‍රධාන පාර්ශව කරුවන් ලෙස පේරාදෙණිය විශ්ව විද්‍යාලය, වයඹ විශ්ව විද්‍යාලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාන්තා කෘෂි ව්‍යාප්ති අංශය, තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, පළතුරු බෝග පර්යේෂණ මධ්‍යස්ථානය, පළතුරු පර්යේෂණ ඒකකය, ශාක ආරක්ෂණ සේවය මෙන්ම ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය, අරණායක ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානය, ආයුර්වේද දෙපාර්තමේන්තුව හා පළාත් සභා හඳුනාගෙන ඇත. BFN ව්‍යාපෘති කාර්යාලය ගන්නෝරුව පිහිටි පැලෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයෙහි පිහිටා ඇත.

ශ්‍රී ලංකාවෙහි මෙම ව්‍යාපෘතිය

- උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩුකුඹුර,
- රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිවුන්හැල්ල
- ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගම්පොල

ග්‍රාමයන් මූලික කරගෙන ක්‍රියාත්මක වේ.






1.නිවුන්හැල්ල, රුවන්වැල්ල



2. උඩුකුඹුර, උඩුදුම්බර



3.ගම්පොල, ගිරිබාව

ශ්‍රී ලංකාව ජෛව විවිධත්වය බහුල ලෙස පවතින රටක් ලෙස හඳුනාගෙන ඇති නමුත් ලංකාවට ආවේණික වූ භෝග බොහෝමයක් තිබුණද ඒවායේ භාවිතය ඉතා අඩු මට්ටමක පවතී. එසේම එම භෝගයන්හි ගුණාත්මක භාවය පිළිබඳ අවබෝධය මද නිසා එම භෝගයන් සංරක්ෂණය කිරීම කෙරෙහි අවධානය ඉතා අඩුවෙන් යොමු කරයි. මෙම පරමාර්ථ මුදුන්පත් කර ගැනීමේ අරමුණ ඇතිව මානව පෝෂණය හා යහපැවැත්ම වැඩි දියුණු කිරිම සඳහා ජෛව විවිධත්වය හා තිරසාර භාවිතය අනුප්‍රවහගත කිරිමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නංවයි.

**මෙම ව්‍යාපෘතිය මගින්,**

කෘෂි ජෛව විවිධත්වය ශක්තිමත් කිරිම, සංරක්ෂණය කිරිම , මානව පෝෂණය වැඩිදියුණු කිරිම හා තිරසාර භාවිතය දේශීය සහ ගෝලීය මට්ටමින් සිදු කිරීමත් ආහාර සහ ජීවනෝපාය ආරක්ෂිත උපාය මාර්ග හා වැඩසටහන් හරහා කෘෂිකාර්මික ජෛව විවිධත්වය සංරක්ෂණය හා තිරසාර කළමණාකරණය ශක්තිමත් කිරීමත් අරමුණු කොටගෙන මෙම ව්‍යාපෘතිය දැනුම ගොඩනැගීම, නීති සහ ප්‍රතිපත්ති ගොඩනැගිම හා දැනුවත් කිරීම යටතේ ක්‍රියාත්මක වේ.

දැනට, සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය ආහාර පෝෂණ සංයුතිය පිළිබඳ තොරතුරු සීමිත වන අතර, තාක්ෂණික දියුණුවත් සමඟ දැනට පවතින තොරතුරු යල් පැනගිය තත්වයට පත්වෙමින් තිබේ. එනිසා ආහාරයට ගත හැකි සාම්ප්‍රදායික වී වර්ග, වෙනත් ධාන්‍ය වර්ග (කුරක්කන්, මෙනේරි), අල වර්ග, පලා වර්ග, එළවළු වර්ග, පලතුරු වර්ග ඇතුළු වර්ග 58 ක පෝෂණ අගය, සංයුතිය විශ්ලේෂණය කිරීම පේරාදෙණිය විශ්ව විද්‍යාලය හා වයඹ විශ්ව විද්‍යාලය මගින් සිදුකරනු ලබන අතර

එමගින් ලැබෙන තොරතුරු අන්තර් ජාලය හරහා හා මුද්‍රිත මාර්ගයන් ඔස්සේ ප්‍රකාශයට පත් කරීමත් ජාතික මට්ටමින් පෝෂණ දත්ත බැංකුවක් ස්ථාපිත කිරීමත් සිදු කරනු ලැබේ.



දේශීය ධාන්‍ය වර්ග



දේශීය පලතුරු සහ දේශීය අල



දේශීය එළවළු සහ පලා වර්ග

ජෛව විවිධත්වය ආරක්ෂා කර ගනිමින් පෝෂණීය වටිනාකමක් ඇති දේශීය ආහාර විවිධත්වය පිළිබඳ උනන්දුව අවදි කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. මෙම අරමුණ මල්පල ගැන්විමේ එක් පියවරක් ලෙස බත්තරමුල්ල හෙළ බොජුන්හල ස්ථාපිත කිරීම සඳහා දායක වීම දැක්විය හැකිය.




බත්තරමුල්ල හෙළබෝජුන් හල ස්ථාපිත කිරීම



පාසල් ගෙවතු වගාවන් ස්ථාපිත කිරිම මගින් මානව පෝෂණය සඳහා ගෙවතු වගාව යොදාගත හැකි ආකාරය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීම, කෘෂි ජෛව විවිධත්වය ආරක්ෂා කර ගනිමින්, ගෙවත්තක් සකස් කර ගන්නා ආකාරය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විමත්, ලබා ගත් දැනුම උපයෝගී කර ගනිමින් සිසුන්ගේ නිවෙස් වලද ගෙවතු වගා සකස් කිරිමේ වැදගත්කම පෙන්වා දිමත්, එමගින් ආර්ථිකය ශක්තිමත් කර ගත හැකි ආකාරය පිළිබඳ සිසුන් දැනුවත් කිරිමත් මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලදි අතර, ගිරිබාව, ගම්පල කණිෂ්ඨ විද්‍යාලයේ ගෙවතු වගාව ස්ථාපිත කල අතර, කාබනික පොහොර නිෂ්පාදනය, කොම්පෝස්ට් සහ මී මැසි පාලනය ප්‍රවර්ධනය කිරිමේ වැඩසටහන් ද මේ වන විට ආරම්භ කර ඇත.



පාසල් ගෙවත්ත ස්ථාපිත කිරීම




අරණායක දේශීය අල ආදර්ශනය ස්ථාපිත කිරීම

BFN ව්‍යාපෘතියේ හවුල්කරුවකු ලෙස කටයුතු කරනු ලබන, රාජ්‍ය නොවන සංවිධානයක් වන අරණායක ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානයෙහි පෝෂණ ගුණයෙන් අනූන පාරම්පරික දේශීය වැල් අල ආදර්ශනයක් ස්ථාපිත කිරිමත්, දේශීය අල ආශ්‍රිත නව නිෂ්පාදන ලෙස කිරි අල චිප්ස්, කිරි අල මුරුක්කු, වැල් අල දොදොල්, වැල් අල ටොෆී, දම්දින අල කැද ආදිය වෙළඳපොලට හඳුන්වාදිමත්, සම්ප්‍රදායික දැනුම යොදා ගනිමින් දේශීය වැල් අල වගා කිරිම පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, වැල් අල ආශ්‍රිත දේශීය ආහාර වට්ටෝරු හඳුන්වා දීමත්, මෙම ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලැබේ. දේශී ආහාර, වැල් අල ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි සැලක් BFN ව්‍යාපෘතියට සමගාමීව ආරම්භ කර ඇත.




දේශීය වැල් අල ආශ්‍රිත නිෂ්පාදන

හෙළ බොජුන් අලෙවි මධ්‍යස්ථානයන් ඉදිකිරීමට දායකත්වය ලබා දෙමින් දේශීය ආහාර පාන නගා සිටුවීමට කටයුතු කිරීමත්, හෙලබොජුන් අලෙවි මධ්‍යස්ථානයන්හි ඇති සාම්ප්‍රදායික ආහාර වට්ටෝරුවල පෝෂණ සංයුතිය නිර්ණය කර ප්‍රදර්ශනය කිරීම සඳහාද කටයුතු කරගෙන යන අතර, එමගින් සමබර ආහාර වේලකට මිනිසා හුරුකිරීම හා සම්ප්‍රදායික ආහාර සඳහා මිනිසා නැවත යොමු කිරීමට උත්සාහ කරනු ලැබේ. තවද දේශීය එළවළු සහ පලතුරු නවතාවයකින් මහජනතාව වෙත ලබාදීම සඳහා කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ කාන්තා කෘෂි ව්‍යාප්ති අංශය සමග අත්වැල් බැඳගනිමින් පුහුණු වැඩසටහන් පැවැත්වීමද, ව්‍යාපෘතිය මගින් ඉටුකරන ලද කාර්යයන් අතර වේ.



පුහුණු වැඩසටහන්

ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ නාගරික ගෙවත්තක් ස්ථාපිත කිරීම හා ශ්‍රී ලංකාව තුල ඌණ භාවිත පලතුරු රැසක් පවතින අතර වෙරළු, අනෝදා, දේශීය අඹ ආදිය ප්‍රයෝජනයට ගනිමින් පලතුරු යුෂ පානය සකස් කිරීම හා එමගින් වාණිජ වෙළඳපොල කරා යොමු වීමේ ක්‍රියාවලිය BFN ව්‍යාපෘතිය හා ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය මගින් මේ වන විට ආරම්භ කර ඇත.



අඩු ඉඩකින් වැඩි අස්වැන්නක්




ඌණ භාවිත පලතුරු ප්‍රචලිත කිරීම

කෘෂි ජෛව විවිධත්වය තුලින් ඉහළ මානව පෝෂණයක් ලගා කර ගැනිම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව සමඟ ද අත්වැල් බැදගත් අතර එහිදී කාන්තාවන් සවිබල ගැන්වීම හා ස්වයං රැකියා වැඩසටහන් හරහා පෝෂ්‍යදායී ඖෂධ ආහාර හා පාන වර්ග භාවිතා කිරීම ප්‍රචලිත කිරීම තුලින් කාන්තාවන් සඳහා ස්වයං රැකියා ලඟා කරගැනිම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා පොත් එළිදැක්වීමත්, මෙම ව්‍යාපෘතියේ අනුග්‍රහය යටතේ සිදුකරනු ලබයි.



පෝෂ්‍යදායී ඖෂධ ආහාර ප්‍රචලිත කිරීම සඳහා පුහුණු වැඩසටහන්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය මඟින් මෙම සියළු තොරතුරු අන්තර්ජාලය වෙත www.bfnsrilanka.org වෙබ් අඩවිය හරහා නිකුත් කිරීමේ මහඟු වූ කාර්යය භාරව කටයුතු කරනු ලැබේ.

මානව පෝෂණය සඳහා ජෛව විවිධත්ව ව්‍යාපෘතියෙහි විවිධාකාරවූ ක්‍රියාකාරකම් මගින්, ලංකාවේ ගෝලීය කුසගිනි දර්ශකය අඩු කිරීමට හා ආහාර සුරක්ෂිත ජාතියක් බිහිකිරීමට මෙන්ම ඵලදායී පරිභෝජනය, සංරක්ෂණය හා තිරසාර කෘෂිකාර්මික ප්‍රවර්ධනය කරා ලාංකිකයන් යොමු කිරීමේ මා හැගි කාර්යයට දායකත්වය ලබාදෙනු ලැබේ.

BIODIVERSITY FOR FOOD AND NUTRITION

Bioversity International

*The GEF 'Mainstreaming biodiversity for nutrition and health' initiative is led by Brazil, Kenya, Sri Lanka and Turkey and coordinated by Bioversity International, with implementation support from the United Nations Environment Programme (UNEP) and the Food and Agriculture Organization of the United Nations (FAO) and additional support from the CGIAR Research Program on Agriculture for Nutrition and Health.*


For more information
Danny Hunter
d.hunter@cgiar.org
Tel: (39) 06 61181228
Fax: (39) 06 61979661
www.b4fn.org

Bioversity International
Via dei Tre Denari 472/a,
00057 Maccarese (Fiumicino),
Rome - Italy
Tel: (39) 06 61181
Fax: (39) 06 6118402
www.bioversityinternational.org

BFN Project Management Unit
P O Box 59,
Plant Genetic Resources Centre,
Gannoruwa, Peradeniya,
Sri Lanka.
Tel: +94-812058380
Fax: +94-812058380
www.bfnsrilanka.org


Convention on Biological Diversity

**The BFN Project contributes to the implementation of the Convention on Biological Diversity's (CBD) Cross-Cutting Initiative on Biodiversity for Food and Nutrition**